**කින්නියා ප්‍රාදේශීය සභාව 2022**
**------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කින්නියා ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට කින්නියා ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීම , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතී රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොමැත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළදී පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් පරිත්‍යාග ලෙස ලැබුණු සහ ප්‍රාදේශීය සභාව විසින් මිලදී ගත් එකතුව රු.927,205ක භාණ්ඩ ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරිමේදි ඇතුළත් කරන බව. | අදාල වත්කම් ස්ථාවර වත්කම්වල ඇතුළත් කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා මීටර් සවිනොකළ වීථි ලාම්පු සඳහා ගෙවිය යුතු වටිනාකම රු.401,856ක් ද ඇතුළුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු.1,102,528ක මුදල ගිණුම්ගතකර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළයුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු සඳහා සහ පෙර වර්ෂයට ගෙවිය යුතු රු.60,600ක විගණන ගාස්තු වෙනුවෙන් ප්‍රතිපාදන වෙන්කර නොතිබුණි. | සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු වෙනුවෙන් ප්‍රතිපාදන වෙන්කිරීම් කර ගෙවීම් කරන බව. | -එම- |
| (ඈ) | පසුගිය වර්ෂයේ මිලදී ගත් රු.199,500ක අධීක්ෂණ කැමරාවේ පිරිවැය ප්‍රාග්ධනිත කර නොතිබුණි. | කොරෝනා වසංගත කාලයේදී අප සභාව විසින් මිලදී ගත් අධීක්ෂණ කැමරාව කින්නියා නඩුත්තිවු ආයුර්වේද රෝහලට ලබාදී තිබූ නමුත් එය ආපසු ලබාගැනීමේ කටයුතු කරන බව. | -එම- |
| (ඉ) | 2021 දෙසැම්බර් මාසය සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිපූරණය කළ වැටුප් සහ සහික දීමනා රු.1,948,935ක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස දැක්විය නොහැක. මක්නිසාදයත්, ජනවාරි මාසයේ ඉහත සඳහන් මුදල ප්‍රතිපූර්ණය කරන බැවින් එලෙස දැක්විය නොහැකිව ඇති බව.<br><br>සුදුසු පිළිතුර ලබාදී නොමැත. | උපචිත පදනම මත ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | 2021 වර්ෂයේ ඉටුකළ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන ව්‍යාපෘති (PSDG) සඳහා සහකාර පළාත් පාලන කොමසාරිස්වරයාගෙන් ලැබී තිබූ රු. 1,796,907ක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ලැබිය යුතු ආදායමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

1.6.2 **විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| **ඉදිරිපත් නොකළ විගණන සාක්ෂි** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.29,879,572 ක් වටිනා ගිණුම් ශේෂ 04 ක් විස්තරාත්මක උපලේඛන සහ භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකි විය. | පිළිතුරු ලබාදී නොමැත. | වත්කම් සම්බන්ධයෙන් නියමිත පොත්පත් පවත්වා ගත යුතුය. |

**1.7 අනුකූල නොවීම**
**නීති, රීති ,රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

නීති, රීති ,රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවූ අවස්ථාවන් පහත දැක්වේ.

| **නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට යොමුව** | | **අනුකූල නොවීම** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි | | | |
| (i) | මු රෙ 371 | රු.380,484ක වර්ෂ 08ක් ඉක්ම වූ අත්තිකාරම් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | අදාල දෙපාර්තමේන්තුවල අනුමැතිය සහිතව කපාහැරීමට කටයුතු කරන බව. | අත්තිකාරම් පියවිය යුතුය. |
| (ii) | මු රෙ 571 | කල් ඉකුත් වූ එකතුව රු. 563,003ක තැනපතු නියාදනය කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කමිටුවක් පත්කර ඇගැයීම් කර වර්ෂ 02ට වැඩි ගිණුම් ආපසු ගෙවීමට කටයුතු කරමින් පවතින බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු. 4,257,574 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු. 4,583,208 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම රු. "000" | බිල්කළ ආදායම රු. "000" | රැස්කළ ආදායම රු. "000" | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. "000" | ඇස්තමේන්තුගත ආදායම රු. "000" | බිල්කළ ආදායම රු. "000" | රැස්කළ ආදායම රු. "000" | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු."000" |
| වරිපනම් හා බදු | 50 | - | - | - | 50 | - | -- | - |
| කුලී | 8,475 | - | 3,034 | - | 9,175 | - | 293 | - |
| බලපත්‍ර ගාස්තු | 1,740 | - | 1,140 | - | 1,595 | - | 5,722 | - |
| වෙනත් ආදායම් | 24,357 | - | 11,255 | 7,382 | 18,680 | - | 36,520 | 7,382 |
| එකතුව | 34,622 | -- | 15,429 | 7,382 | 29,500 | -- | 42,535 | 7382 |

- සමාලෝචිත වර්ෂයේ හා පසුගිය වර්ෂයේ බිල්කළ ආදායම් ඉදිරිපත් කර නොතිබුණි.

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම් හා බදු** | | |
| | 1946 අංක 30 දරණ වරිපනම් හා තක්සේරු ආඥා පනතේ 20 වගන්තිය අනුව වරිපනම් තක්සේරු කර නොතිබුණි. | දේපළ තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් සිදුකර ඇති බව. | තක්සේරුව කඩිනම් කළ යුතුය. |
| **(ආ)** | **කුලී** | | |
| | බදුකුලී හිමියන්ගෙන් 2007 සිට 2021 දක්වා කාලපරිච්ඡේදයට අයකළ යුතු මුදල රු.7,382,901ක් විය. | මෙම බදුකුලී වටිනාකමට අදාල විස්තර ලබාගැනීමට නොහැකි වීම හේතුවෙන් මෙය නිර්ණය කිරීමේ දුෂ්කරතා මතු වී ඇත. එමනිසා, මෙය විධිමත්ව අධ්‍යනය කර කපාහැරීමට සභාව තීරණය කර ඇති බව. | හිඟහිටි සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගතයුතු වේ. |
| **(ඇ)** | **උසාවි දඩ මුදල් සහ මුද්දර ගාස්තු** | | |
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ අනෙකුත් බලධාරීන්ගෙන් අයකර ගතයුතු මුද්දර ගාස්තු රු.5,935,798ක් විය. | මේ වන විට මුද්දර ගාස්තු අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | සුදුසු ක්‍රියාමාර්ග ගතයුතුය. |
| (ii) | කින්නියා ප්‍රාදේශීය සභාවේ 2016 සිට 2019 දක්වා කාලපරිච්ඡේදයට අයත් | මුද්දර ගාස්තු නියෝජ්‍ය ප්‍රධාන (මූල්‍ය) මගින් නැගෙනහිර පළාත් දේශීය | ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති 81 අනුව |

| | | |
|---|---|---|
| ඉල්ලීම් කර ලබාගත යුතු මුද්දර ගාස්තු රු.2,495,500ක් ලබාගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් එම මුදල පළාත් සභා අරමුදලට බැර කර තිබුණි. | ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලබාගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව. | කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| <u>විගණන නිරීක්ෂණය</u> | <u>සභාවේ අදහස් දැක්වීම</u> | <u>නිර්දේශය</u> |
|---|---|---|
| 2022 මාර්තු 21 දින පළාත් පාලන සංවර්ධන ප්‍රදාන ව්‍යාපෘතිය (LDSP) යටතේ මිලදී ගත් එකතුව රු.2,150,000ක් වූ ඝන අපද්‍රව්‍ය පොහොර බවට පත්කිරීමේ යන්ත්‍ර 03ක් මේ දක්වා සවිකර නොතිබූ අතර නිසි පරිදි නඩත්තු කිරීම් සිදුකර නොතිබූ බව ද නිරීක්ෂණය විය.. | මෙම යන්ත්‍ර වර්තමානයේ International Kinniya mamu Pvt (Ltd) යන ආයතනය සමග ගිවිසුම්වලට එළැඹීමට ක්‍රියාමාර්ග ගෙන සහකාර පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතිය සඳහා යවා ඇත. ඒ සඳහා අනුමැතිය ලැබූ විගස අදාල යන්ත්‍ර සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව. | යන්ත්‍ර ඵලදායී ලෙස භාවිතයට ගත යුතුය. |

**3.2 වත්කම් කළමනාකරණය**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| **(අ)** | **නිෂ්කාර්ය වත්කම්** | | |
| (i) | 2016 වර්ෂයේ සභාවේ අරමුදලින් රු. 199,762කට ඉදිකළ උප්පාරු පොදු වැසිකිලිය ජල පහසුකම් සලසා නොදීම හේතුවෙන් වර්ෂ 08ක කාලයක් භාවිතයකින් තොරව නිෂ්කාර්යව පැවැතුණි. | වර්තමානයේ NGO මගින් නල ළිඳකින් පහසුකම් සලසා දීමෙන් මහජනතාවට භාවිතා කිරීමට හැකි පරිදි කටයුතු කර ඇති බව. | සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ii) | 2016 වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG) ව්‍යාපෘතියෙන් රු. 897,155කින් ඉදිකළ ගොඩනැගිල්ල වර්ෂ 08ක කාලයක් භාවිතයකින් තොරව නිෂ්කාර්යව පැවැතුණි. | අදාල ගොඩනැගිල්ල අත්පත් කර ගැනීමේ ඉදිරි ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | -එම- |
| (iii) | 2022 දෙසැම්බර් 29 දින පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG) ව්‍යාපෘතියෙන් මිලදී ගත් රු.410,000ක් වූ කොහු නිෂ්පාදන යන්ත්‍රය භාවිතා නොකර නිෂ්කාර්යව පැවැතුණි. | කොහු නිෂ්පාදන යන්ත්‍රය භාවිතා කිරීම සම්බන්ධයෙන් පළාත් පාලන සහකාර කොමසාරිස්වරයාගේ අනුමැතිය සඳහා යවා ඇත. අනුමැතිය ලැබීමෙන් පසු ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව. | -එම- |
| **(ආ)** | **පවරා නොගත් වත්කම්** | | |
| | සභාව විසින් භාවිතා කරනු ලබන වාහන 09ක් සභාවේ නමට මාරුකිරීමට ක්‍රියාමාර්ග | සභාව විසින් භාවිතා කරන වාහනවල අයිතිය සභාවේ නමට | හිමිකාරිත්වය මාරුකිරීමට සුදුසු |

| | | |
|---|---|---|
| ගෙන නොතිබුණි. | මාරුකිරිමට ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 3.3 කර්තව්‍යයන් ඉටුකිරිමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ රු.27,272,144ක් සන අපද්‍රව්‍ය රැස්කිරීමේ මධ්‍යස්ථානය 2011 සිට 2017 දක්වා කාලපරිච්ඡේදයේ ඉදිකර තිබුණත් එහි මෙහෙයුම් කටයුතු සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ආරම්භ කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ සභාවේ අභ්‍යන්තර විගණන නිලධාරියෙකු පත්කර තිබූ නමුත් විගණන කාර්යයන් කිසිවක් සිදුකර නොතිබුණි. | සභාවේ අභ්‍යන්තර විගණන නිලධාරියා විසින් වර්තමානයේ අභ්‍යන්තර විගණන කාර්යයන් සිදුකරන බව. | අභ්‍යන්තර විගණන කාර්යයන් විධිමත්ව සිදුකිරීමට පියවර ගත යුතුය. |

### 4.2 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ ඇස්තමේන්තු කළ වියදම් සහ තථ්‍ය වියදම් අතර සියයට 10 සිට සියයට 54ක් දක්වා විචලනයන් වූ බැවින් අයවැය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස භාවිතා කර නොතිබුණි. | ඉදිරියේදි නිවැරදිව කටයුතු කරන බව. | අයවැය ලේඛනය පාලන කාරකයක් ලෙස යොදාගත යුතුය. |